www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ යුද්ධයෙන් ඇෆ්ගන්වරු කී දෙනෙකු මිය යනු ඇත්ද?

**How many Afghans will die in Obama's war?**

2009 දෙසැම්බර් 7

ඇෆ්ගනිස්තාන යුද්ධය උත්සන්න කිරීමේ බැරැක් ඔබාමාගේ තීන්දුව පිළිබඳ මාධ්‍ය වාර්තාවන් තුල මතු නොකල හා පිළිතුරු නොදුන් එක් ප්‍රශ්නයක් නම් කොපමන ප්‍රමානයක්, දහස් ගනනක්, දස දහස් ගනනක් හෝ සිය දහස් ගනනක් ඇෆ්ගන් සිවිල් වැසියන් එක්සත් ජනපද මිලිටරි ප්‍රචන්ඩත්වයෙන් මිය යාවිද යන්නයි.

අනෙකුත් නැටෝ රටවලින් අවම වශයෙන් 7,000 ක සේනාවක් ද සහිතව 30,000ක අමතර එක්සත් ජනපද (එජ) හමුදාවක් යැවීමේ අර්ථය නම් අති දැවැන්ත පරිමානයකින් ප්‍රචන්ඩත්වය උග්‍ර කිරීමයි. ඔබාමාගේ හමුදා ප්‍රසාරනය අවසන් වන විට ඇෆ්ගනිස්තානය තුල බුෂ් පරිපාලනය විසින් පසුගිය වසර වල රඳවනු ලැබ තිබූ සංඛ්‍යාව තුන් ගුනයක් වනු ඇත.

පෙන්ටගනයේ කුහක ප්‍රකාශනයක් තුල ඇෆ්ගනිස්තානයේ ප්‍රධාන එජ කොමාන්ඩර්වරයා වන ස්ටැන්ලි මැක්ක්‍රිස්ටල් විසින් වර්ධනය කල කැරලි මර්දන ක්‍රියා පිළිවෙත එල්ල කර ඇත්තේ "මහජනයා ආරක්ෂා කිරීමට" හා "තැලිබාන්වරු අපකීර්තියට පත් කිරීමට" යයි පවසා ඇත. භාවිතයේදී මෙහි අර්ථය නම් විදේශ ආක්‍රමනයට ප්‍රතිරෝධය දක්වන සියල්ලන් තලේබාන්වරු ලෙස සලකා විනාශයට ඉලක්ක කිරීමයි.

මැක්ක්‍රිස්ටල් හා වත්මන් එජ ප්‍රධාන අනදෙන නිලධාරී ඩේවිඩ් පෙට්රියස් විසින් ඉරාකයේදී වර්ධනය කරන ලද කැරලි මර්දන ක්‍රියා පිළිවෙත නව සොයා ගැනීමක් නොව ඇමරිකානු අධිරාජ්‍යවාදය වියට්නාමයේ යෙදූ ක්‍රමෝපායයන් (එමෙන්ම ප්‍රන්සය, ඇල්ජීරියාව හා බ්‍රිතාන්‍යය සිය අසංඛෙය යටත් විජිත යුද්ධ තුල) යලි ඉස්මත්තට ගැනීමකි. ඇෆ්ගනිස්තානයේ බහුතර ගම්බද ජනතාව පාලනය කිරීමට පහසු ආකාරයට විශේෂයෙන්ම කාබුල් හා කන්දහාර් වැනි රටෙහි ප්‍රධාන නගර වල විශාල සමූහ ලෙසට ගාල් කරනු ලැබෙනු ඇති අතර ප්‍රතිරෝධය දක්වන්නවුන් කැරලිකරුවන්ට සහය දෙන්නවුන් ලෙස නම් කරනු ඇත.

ඇෆ්ගන් ආන්ඩුවේ හමුදා දහවල් කාලයේ මුර සංචාරය කරන්නා වූ ද තලේබාන් හමුදා රාත්‍රී කාලයේදී ආධිපත්‍ය දරන්නාවූ ද කන්දහාර් නගරය තුලට දැවැන්ත එජ හමුදාවක් එවීම ද මැක්ක්‍රිස්ටල් ගේ එක් ඉලක්කයක් විය. මෙහි අදහස විය හැක්කේ දශ ලක්ෂ 3ට ආසන්න ජනගහනයක් වෙසෙන නගරයේ නිවසින් නිවසට ගොස් ෆලූජා ආකාරයේ සටනක් දියත් කිරීම ය.

ඇමරිකානු ජන මාධ්‍ය විසින් අවංක ලෙස වාර්තා කිරීමක් බලාපොරොත්තු විය නොහැකි වුවද එජ හමුදා තර කිරීම නිසා සිවිල් මරන සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහල යනු ඇත. සිවිල් මරන වාර්තා කිරීම වෙනුවට ඇමරිකානු බෝම්බ මිසයිල ෂෙල් වෙඩි ආදියෙන් සිදුවන මරන "තැලිබාන්" "ත්‍රස්තවාදී" හෝ නවතම ආකාරයට "නරක මිනිසුන්" ලෙස විස්තර කෙරෙනු ඇත.

යුද්ධය උත්සන්න කිරීමේ සිය තීන්දුව පිළිබඳ පිළිගත හැකි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට ඔබාමා පරිපාලනය උත්සුක වූයේ නැත. පෙන්ටගන් වාර්තා අනුව ඇෆ්ගනිස්තානය තුල තවමත් සිටින අල් කයිඩා සාමාජික සංඛ්‍යාව සියයකට අඩු වුවද ඔබාමා සිය වෙස්ට් පොයින්ට් කතාව තුලදී 9/11 ට වහාම පසුව එළඹුනු දින කිහිපය සිහියට නැංවීමට යත්න දැරීය.

අල් කයිඩා නොවැදගත් සාධකයක් වීමත් සමග සිය රටෙහි අධිරාජ්‍යවාදී ආක්‍රමනයට එරෙහිව ආයුධ ගන්නා ඕනෑම ඇෆ්ගනිස්තාන වැසියකු ඝාතනය කිරීමට එජ යුද උත්සාහය ක්‍රියාත්මක වනු ඇත. යටත් විජිතවාදයට එරෙහි ඇෆ්ගන් ප්‍රතිරෝධයේ වසර 150කට වඩා වැඩි දෙන ලද ඉතිහාසය සැලකූ කල දස ලක්ෂ 30ක් වන රටෙහි සමස්ත ජනගහනයම ඉලක්ක බවට පත්වීමට හැකියාව තිබේ.

ඉරිදා පලවන නිව්යෝක් ටයිම්ස් පුවත් පතෙහි "වීක් ඉන් රිවීව්" කොටසේ ස්කොට් ෂේන් ගේ විශ්ලේෂනයට අනුව යථා වශයෙන් ගත් කල ඉලක්ක ගත ජනගහනය මීටත් වඩා වැඩි සංඛ්‍යාවකි. ඇෆ්ගන් පෙදෙසේ දශ ලක්ෂ 15ද, පකිස්තාන පෙදෙසේ දශ ලක්ෂ 27ද වන ඇෆ්ගනිස්තාන-පකිස්තාන දේශ සීමාව

දෙපස ජීවත් වන සම්පූර්න පශ්තුන් ජනගහනයට එරෙහිව එජය සටන් වැදීමට සිදු විය හැකි බව ඔහු සඳහන් කරයි. ඇෆ්ගනිස්තානයේ හා පකිස්තානයේ පශ්තුන් ප්‍රදේශ වල සමස්ත ජනගහනය දශ ලක්ෂ 57 කි. එම ප්‍රමානය ප්‍රන්සයේ හෝ ඉතාලියේ ජනගහනයට සමානවේ.

මේ දක්වා ඇෆ්ගනිස්තාන යුද්ධයේ සිවිල් මරන පිලිබඳ දක්වා ඇති සැලකිල්ල අතිශයින්ම අල්පය. ස්වාධීන අධීක්ෂන කන්ඩායම් වල වාර්තාවන්ට අනුව සිවිල් මරන සංඛ්‍යා පිලිබද දත්ත පිලිවෙලකට එකතු කිරීම ආරම්භ කෙරුනේ ඇමරිකානු ආක්‍රමනයෙන් හා තැලිබාන් පාලනය අහෝසි කිරීමෙන් වසර හයකට පසුව 2007 දීය. එක්සත් ජාතීන්ගේ සංවිධානය (එජාස) සිවිල් මරන පිලිබඳ දත්ත ගබඩාවක් තනා ඇති නමුදු එම ගබඩාව මහජනයා හට විවෘත කර නැත. එජාස නිල අර්ධ වාර්ෂික වාර්තාවන්ට අනුව 2008 හා 2009 දෙවසරෙහි ම මරන සංඛ්‍යාව 2000ක් පමනවේ.

මෙම සංඛ්‍යාව අතිශය අඩු තක්සේරුවක් බව නිසැකය. රටෙහි නැගෙනහිර හා දකුනෙහි විශාල පෙදෙසක හා රටපුරා විසිර පවතින දිස්ත්‍රික්ක වල තැලිබාන් පාලනයට එරෙහි එජ මිලිටරි ප්‍රහාරයන්ගෙන් සිවිල් මරන සංඛ්‍යාව ඉහල යාමට නියමිතව පැවතිනි. බිම් මෙහෙයුම් සමග බෝම්බ යානා, ප්‍රහාරක හෙලිකොප්ටර්, දුරස්ථ පාලක මිසයිල හා කාල තුවක්කු ඇතුලත් දැවැන්ත ගිනිඅවි ප්‍රහාර මුදා හැරෙනු ඇත. එජ හා මිත්‍ර ගුවන් හමුදා විසින් නව හා වඩා දැවැන්ත බෝම්බ යොදා ගනු ඇති අතර මින් සමහරක් පාපන්දු පිටියක තරම් ප්‍රදේශයක පවතින සියලු ම පන ඇති ද්‍රව්‍ය වාෂ්ප කර හැරීමට තරම් ප්‍රබලය. ඉරාකයේදී යොදා ගත් නව ආයුධ සන්නද්ධ බිම් බෝම්බ වලට ප්‍රතිරෝධය දක්වන වාහන, පාරවල් නොමැති ඇෆ්ගන් භූමි තත්වයන්ට අනුව යලි සකස් කර මිලිටරිය විසින් යොදා ගැනෙනු ඇත.

2010හි වසන්තය වන විට ඇෆ්ගනිස්තානය තුල සිටින එජ හමුදාවන්ගේ සංඛ්‍යාව 1980 ගනන්වල දී මොස්කව් මැදිහත්වීමේ උච්චතම අවධියේදී සෝවියට් සංගමය විසින් යොදවන ලද හමුදා සංඛ්‍යාව වන 110,000ට ආසන්න වනු ඇත. නැටෝ සාමාජික රට වල හා අනෙකුත් එජ මිත්‍ර රටවල හමුදා සංඛ්‍යාව 45,000 දක්වා වැඩි කිරීම සමග ගනන් ගත් විට සමස්ත අධිරාජ්‍යවාදී හමුදා සංඛ්‍යාව 145,000 වන අතර එම සංඛ්‍යාව සෝවියට් හමුදාවන්ට වඩා අතිශයින් ඉහල ප්‍රමානයකි.

ඉරිදා උදැසන රූපවාහිනී ජාල තුනක් සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී රාජ්‍ය ලේකම් සමග එහි පෙනී සිටි එජ ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස්ගෙන් මේ කරුන පිලිබඳව ප්‍රශ්න කරනු ලැබීය. 1980 ගනන්වල දී ගේට්ස් සීඅයිඒ සංවිධානයේ උප ප්‍රධානියා වූ අතර සෝවියට් මිලිටරියට එරෙහිව සටන් වැදීම සඳහා ආයුධ හා මුදල් ලබාදීමේ හා බඳවා ගැනීමේ ප්‍රධාන කර්තව්‍යය ඉටු කලේ ඔහු ය. (මෙම මෙහෙයුමෙහිදී අනෙකුන් අතර ඔසාමා බින් ලාඩන් හා දැනට තලේබාන් ව්‍යාපාරයේ නායකත්වයේ සිටින බොහෝ දෙනෙකු සම්බන්ධ කර ගනු ලැබිනි).

සෝවියට් සංගමය අසමත් වූ ඇෆ්ගනිස්තාන යුද්ධයෙන් ඇමරිකාව සාර්ථක වන්නේ කෙසේද යන්න 1980 ගනන් වල අත්දැකීම් මත පදනම්ව වැඩ සටහන් කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබිනි. සෑම අවස්ථාවක ම ඔහු දුන් පිලිතුර වූයේ ඇෆ්ගනිස්තානයේ සිදු කල සෝවියට් ආක්‍රමනයේ ප්‍රතිපලය වූයේ දශ ලක්ෂයක් මරනයට පත්ව දශ ලක්ෂ පහක් සරනාගතයින් වූ බවයි. වත්මන් එජ ආක්‍රමනය උත්සන්න කිරීමේ ප්‍රතිපල ලෙසට මරන හා සරනාගත සංඛ්‍යාව කොපමනක් විය හැකි දැයි ඇසීමට කිසිම සාකච්ඡාකරුවකු උනන්දු වූයේ නැත. එම ප්‍රමානය ඊටම සමාන වීමට බොහෝ ඉඩ ඇත.

මෙය අතිශයෝක්තියකැයි යමෙක් බැහැර කිරීමට සිතුව ද, මතු කල යුතු කරුන වන්නේ එජ විසින් සිදු කල ඉරාක ආක්‍රමනයේ දී වඩාත් කීර්තිමත් ගනන් බැලීමට අනුව පවා දශ ලක්ෂයක් මිය ගිය අතර දශ ලක්ෂ පහක් සරනාගතයින් වූ බවයි. දැන් ඇෆ්ගනිස්තාන ජනයා මත පැටවන්නේ එම පරිමානයේම මිලිටරි විලෝපනයකි.

මෙම සංඛ්‍යාවන් එක් දේශපාලන නිගමනයකට නිතැතින්ම පාර කපයිඃ ඇෆ්ගනිස්තානය තුල යුද්ධය උත්සන්න කිරීම ඓතිහාසික පරිමානයේ සාපරාධී ක්‍රියාවක් වන අතර අපරාධකරුවන් වන ඔබාමා, ගේට්ස්, ක්ලින්ටන්, මැක්ක්‍රිස්ටල්, පෙට්‍රියස්, උප ජනාධිපති බිඩන්, ඒකාබද්ධ හමුදා ප්‍රධානීන්ගේ සභාපති මුලෙන් ආදීන් ඉරාකය තුල ලේ ගංගාව නිර්මානය කර ක්‍රියාත්මක කල මොවුන්ගේ පූර්වගාමිකයන් මෙන්ම වරදකරුවෝ වෙත්.

බුෂ්, චේනී, රම්ස්ෆෙල්ඩ් සහ සමාගම නීති විරෝධී ඉරාක ආක්‍රමනය සඳහා යුද අපරාධකරුවන් ලෙසට නීතිය ඉදිරියට පැමිනවිය යුතු බවට ලෝක සමාජවාදී වෙබ් අඩවිය දිගු කලක සිට කියා සිටියේය. ඊට සමාන වූ පරිමානයේ අපරාධයක් ඇෆ්ගනිස්තානය තුල දිග හැරෙන තතු තුල ලෝකයේ වැඩ කරන ජනතාවට හා තරුන ජනතාවට අප කියා සිටින්නේ එජ-නැටෝ යුද්ධය වහාම නතර කරන ලෙසත් එය සැලසුම් කිරීමට හා මෙහෙයවීමට වග කිව යුතු සියලු ම දෙනා නීතිය ඉදිරියට පමුනුවන ලෙසත් බල කරන ලෙස ය.

පැට්‍රික් මාටින්

© www.wsws.org